කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2013

2016 - ඔක්තෝබර්

**BCOME 2054** - සාර්ව ආර්ථික විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව : (හතයි) 07

කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. සාර්ව ආර්ථික විද්‍යා ප්‍රතිපත්ති (Economic policy instruments ) මෙවලම් ආර්ථිකයක් පාලනයට කෙසේ යොදාගත හැකිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. " මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ සිදුවන වැඩිවීම සැමවිටම සුබසාධනයේ වැඩි වීමක් ලෙස අර්ථ දක්වයි ".

i. මෙම අර්ථ දැක්වීමේ සමහර ගැටළු මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. මෙහි ඇති විශාලම ප්‍රශ්නය යැයි ඔබ සිතන්නේ කුමක්ද ? එය එසේ වන්නේ ඇයි ?

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

02 අ. i. ආර්ථික ව්‍යුහයක විදීම් හා කාන්දුවීම් යන්නෙන් කුමක් අදහස් කරන්නේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii ආර්ථිකයක ආදායම් හා වියදම් වෘත්තාකාර ප්‍රවාහයට මෙම විදීම් හා කාන්දුවීම් බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ආ. අංශ හතරක් සහිත ආර්ථිකයක ආදායම් හා වියදම් වෘත්තාකාර ප්‍රවාහ රූපසටහනක් උපයෝගි කරගෙන විස්තර කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

03. අ. "මූල්‍ය ප්‍රසාරණයක් ඉහල නිමවුමකට හා අඩු පොලී අනුපාතයකට යොමු කරයි ". මෙම ප්‍රකාශය විවේචනාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. කල්පිත ආර්ථිකයක සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබට දී ඇත.

| | | |
|---|---|---|
| පරිභෝජනය | (C) | $= 100 + 0.8\ Y$ |
| ආයෝජන | ( I) | $= 100$ |
| රාජ්‍ය වියදම් | (G) | $= 150$ |
| රාජ්‍ය බදු ආදායම් | (T) | $= 30 + 0.25\ Y$ |
| අපනයන | (X) | $= 170$ |
| ආනයන | (M) | $= 15 + 0.2Y$ |

Y හා Yd ආදායම සහ වැයකළ හැකි ආදායම වශයෙන් පිළිවෙළින් වූ අවස්ථාවේ, ඔබ විසින් ගණනය කළ යුත්තේ

i. සමතුලිත ආදායම් මට්ටම

(ලකුණු 04)

ii. සමතුලිත ආදායමේදී පරිභෝජන මට්ටම

(ලකුණු 03)

iii. සමතුලිත ආදායමේදී ශුද්ධ අපනයන මට්ටම

(ලකුණු 03)

iv. ආයෝජන රු. 100 ඉහල ගියහොත් සමතුලිත ආදායම කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේද ?

(ලකුණු 02)
(මුළු ලකුණු 20)

04. අ. i. IS සහ LM වක්‍ර වල බෑවුම තීරණය වීමට බලපාන සාධක විස්තර කරන්න.

(ලකුණු 05)

ii. මුදල් සැපයුමේ වෙනස්වීම හා මුදලට ඇති ඉල්ලුම වෙනස්වීම LM වක්‍රයට බලපාන්නේ කෙසේද ?

(ලකුණු 05)

ආ. i. විවෘත ආර්ථික සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. අපනයන හා ආනයන IS වක්‍රයට බලපාන්නේ කෙසේදැයි ප්‍රස්ථාරිකව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

05. අ. ආර්ථික විද්‍යාඥයින් උද්ධමනය පිළිබඳව අවධානය යොමු කරනනේ ඇයි ?

(ලකුණු 08)

ආ. ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි අවධානය යොමු කරමින් උද්ධමනය පහත සඳහන් කණ්ඩායම් වලට කෙසේ බල පාන්නේ දැයි පැහැදිලි කරන්න.

i. වැටුප් උපයන්නන්

ii. ස්ථිර ආදායම් උපයන්නන්

iii. සැපයුම් කරුවන්

(එක් කොටසකට ලකුණු 04 බැගින් )

(මුළු ලකුණු 20)

06. අ. i. පිලප්ස් වක්‍රය විස්තර කරන්න.

(ලකුණු 05)

ii. පිලිප්ස් වක්‍රයේ සෘණ බෑවුමට බලපාන හේතු සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ආ. ශ්‍රී ලංකාවේ වර්තමාන විරැකියාව පාලනයට ගතයුතු විවිධ පියවරයන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

07. පහත දෑ පිළිබඳව කෙටිසටහන් ලියන්න.

අ. සමාහාර සැපයුම     ආ. ආයෝජන ශ්‍රිතය

ඇ. වියදම් ගුණකය     ඉ. දළ දේශීය නිෂ්පාදිතය

ඊ. අංශ තුනක ආර්ථිකය

(එක් කොටසකට ලකුණු 04 බැගින් )

(මුළු ලකුණු 20)